# වෙළෙඳපල අගැයීමක්

මහා පරිමාන කෘෂිකාර්මික ව්‍යාපෘතියක සාර්ථක භාවය කෙනෙකුට අංශ කිපයකින් විග්‍රහකර බැලිය හැක. මෙයින් බොහෝ දෙනා ව්‍යාපෘතිය මගින් ජනනය කරනු ලබන ආදායම, රැකියා ඉපදයම, නිෂ්පාදනය සහ අවසානයේදී ජීවන තත්ත්වය උසස්වීම යන කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොම කරති. කෙසේ වෙතත් මෙම සංවර්ධන ඉලක්කයන් අපේක්ෂිත ආකාරයෙන් ලබා ගැනීමට නම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දින සිට කිසියම් කාල පරිච්ඡේදයක් යන තුරුම එහි ආර්ථික සහ සමාජ වර්ධනයන් උදෙසා විවිධ උපක්‍රම භාවිතා කල යුතුව ඇත. මෑතක් වන තුරු ශ්‍රී ලංකාවේ සැලසුම් කරුවන් විසින් ව්‍යාපෘතියක වර්ධනය සඳහා මලික වශයෙන් වාරිමාර්ග ක්‍රම සංවිධානය සහ ඊට අදාල සමාජ ආර්ථික පාදක ව්‍යුහය සකස් කිරීම, යන කාරණා කෙරේ වැඩි අවධානයක් යොමු කෙරුණි. කෙසේ වෙතත් අතීතයේ මෙම ක්‍රියාවලියේදී ව්‍යාපෘතියක සාර්ථක භාවය සඳහා බලපාන වෙළඳ මධ්‍යස්ථානයන්ගේ කාර්ය භාරය මැනවින් හඳුනා ගනු නොලැබිණ

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී
එල්. ඩී. අයි. විජේතුංග විසිනි

එහෙත් මෑත කාලීන සැලසුම්කරුවන් විසින් නව ජනපද ව්‍යාපාරවල සංවර්ධනයේ ලා වෙළඳ නගරවල වැදගත්කම හඳුනාගෙන ඇති අතර කිරිඳිඔය ව්‍යාපෘතියේද ආරම්භයේ සිට එහි සාර්ථක භාවයට හැම අංශයකින්ම බලපාන ප්‍රධාන නගර සහ උප නගරවල අවශ්‍ය



භාවය මැනවින් හඳුනා ගනු ලැබ ඇත. මේ අනුව, දැනට පැරණි ජනපදයේ පිහිටි නගර වලට අමතරව ව්‍යාපෘතිය මගින් ඇරඹි නව ජනපදයේ අවශ්‍යතා සඳහා නව නගර කීපයක් පිහිටවනු ලැබීය. ඒ තුළින් ජනපදිකයන්ගේ නිෂ්පාදන භාණ්ඩ අලෙවි කිරීම සහ තම පාරිභෝගික අවශ්‍යතා සපුරා ලීමට අවශ්‍ය මූලික පසුබිම සකස් කිරීම අපේක්ෂිතය.

**කිරිඳිඔය ප්‍රදේශයේ වෙළඳ මධ්‍යස්ථානය:**

සංවර්ධන මට්ටම බලනවිට ව්‍යාපෘති ප්‍රදේශය අංශ දෙකකට බෙදිය හැක. එක් අංශයක් පැරණි ජනපදය වන අතර අනෙක් අංශය නව ජනපදය වේ. තිස්ස නගරය පැරණි ජනපදයේ ප්‍රධාන නගරයක් වශයෙන් පිහිටා ඇති අතර උප නගර වශයෙන් දෙබරවැව සහ පන්නගමුව පිහිටා ඇත. තිස්ස නගරය ආගමික තැ[illegible] මුල් කරගෙන බිහිවූ පැරණි ජනපදයේ කෘෂි නිෂ්පාදන මගින් පෝෂණය වේ. එය සේවා සහ ද්විතීය අංශ තුළ සීඝ්‍රව වර්ධනය වන, කතරගම සහ අම්බලන්තොට යන නගර දෙක සම්බන්ධ කරන ව්‍යාපෘති ප්‍රදේශයේ ප්‍රධාන නගරයයි.

දෙබරවැව උප නගරය කෘෂිකාර්මික ගම්මාන ආශ්‍රිතව බිහිවුවද, වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙන් මූලික අවස්ථාවේ පවතී. මෙම නගරය පැරණි ජනපදයේ සහ නව ජනපදයේ මාර්ග සමග සමීප සම්බන්ධතාවයක් පවතී. කෙසේ වෙතත්, තිස්ස නගරයේ දියුණුවට භූගෝලීය වශයෙන් යම් සීමාකම් පවතින නිසා, සමහර පරිපාලනමය සහ සේවා මධ්‍යස්ථාන දෙබරවැව නගරයට ඒකරාශී වෙමින් පවතී

පන්නගමුව උප නගරය මුලදී පොළක් වශයෙන් බිහිව අද පැරණි සහ නව ජනපදිකයන්ගේ කෘෂි නිෂ්පාදිත අලෙවි මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක වේ. මූලික වශයෙන් මෙම උප නගරය, කෘෂි නිෂ්පාදන තොග වෙළඳ පලක් බවට පත්ව ඇත. නව ජනපදිකයන්ගේ වෙළඳ සබඳතාවයන් මෙම උප නගරය සමග දිනෙන් දින වැඩිවන තත්ත්වයක් පෙන්නුම් කෙරේ.

ලුණුගම්වෙහෙර නව ජනපදයේ ප්‍රධාන නගරයක් වශයෙන් ක්‍රියාකාරී වන අතර වම් සහ දකුණු ඉවුරු නියෝජනය වන ආකාරයෙන් උප නගර දෙකක් පිළිවෙලින් බෙරලිගල සහ වීරවිල නමින් පිහිටවා ඇත. ලුණුගම්වෙහෙර නගරය දකුණු ඉවුරට යාබදව පිහිටා ඇති අතර, තිස්ස, වැල්ලවාය නගර යා කරන ප්‍රධාන මාර්ගයට සමීපව පිහිටා ඇත. එම නගරයේ පිහිටීම භූගෝලීය වශයෙන් හිතකර වේ.

වීරවිල පැරණි ගමකි. එය දකුණු ඉවුරේ සංවර්ධනයත් සමග එම ප්‍රදේශයේ වර්ධනය උදෙසා, වෙළඳ මධ්‍යස්ථානයට අවශ්‍ය ආකාරයෙන් සකස් පිහිටුවනු ලැබීය. මෙම නගරය තිස්ස සහ කොළඹ මාර්ගයේ අසල පිහිටීම නිසා ඉතා ඉක්මණින් අනෙකුත් වෙළඳ මධ්‍යස්ථාන වලට යෑමේ ඉඩ ප්‍රස්ථාව ලබාගෙන ඇත.

බෙරලිගල උප නගරය වම් ඉවුරේ පිහිටි ප්‍රධාන පාරවල් සහ අතුරු පාරවල් වලට ඔබ්බෙන් පිහිටි නගරයකි. එය වම් ඉවුරට යාහැනි මාර්ගයකින් පමණක් සම්බන්ධ වී පවතී. දැනට වම් ඉවුරේ මුල් ගම්මාන වල පදිංචිකරුවන්, වඩා සමීප වෙළඳ මධ්‍යස්ථානයක් ඇති ලුණුගම්වෙහෙර සමග සබඳතාව පවත්වන අතර ඉවුරේ පහළ කොටසේ අය පමණක් බෙරලිය නගරය සමග සබඳතා පවත්වා ගෙනයයි. ව්‍යාපෘතියේ අනෙක් නගර හඳුනා දීමේදී තිබූ ඇතැම් භූගෝලීය වාසි සහගත තත්ත්වයන් බෙරලිය නගරයට හිමිවී නොතිබුණි.

**නව ජනපදිකයන්ගේ වෙළඳපොළ ස්වරූපය:**

කිරිඳිඔය කෘෂිකාර්මික ජනපදයක් විශේෂිත කොට ගෙන, එය කෘෂි නිෂ්පාදන අලෙවිය සහ පාරිභෝජන සේවා සැපයුම මත පදනම් වූ වෙළඳ පොළක් ලෙස සකස් වී පවතී. වී නිෂ්පාදනය ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයකි. වී සඳහා සහතික මිලක් තිබෙන නමුදු වී සඳහා ප්‍රදේශයේ ඉල්ලුම තරඟකාරී වේ. වෙළඳ තරඟකාරිත්වය පිටතින් පැමිණෙන වෙළඳුන් සහ ප්‍රදේශයේ වෙළඳුන් තුළින් සිදුවී ඇති අතර එකී දායකත්වය 1986 යල් කන්නයේදී පිළිවෙලින් නිෂ්පාදන අලෙවියෙන් 55% සහ 45% විය. එහිදී වී බුසලක මිල පිළිවෙලින් රු. 73.70 හා 74.62 වශයෙන් නිර්ණය වී ඇත. නමුත් මෙම තරඟකාරී මිල නව ජනපදිකයන්ට තවමත් ලබාගත හැකි නොවේ. මෙහිදී මූලික හේතුන් වශයෙන් පෙන්වා දිය හැක්කේ වෙළඳ පොල ප්‍රසාරණය නොවීමය. විශේෂයෙන් හොඳින් වර්ධනය නොවූ ගොවි ආර්ථිකයක් නිසා, ගොවීනට කේවල් කිරීමේ ශක්තිය සීමාවී පවතී. අනෙක් අතට නිෂ්පාදකවරු සහ මිලදී ගන්නන් අතර හඳුනා

ගැනීම හා ආර්ථික සම්බන්ධතා හොඳින් ගොඩ නැගී නොතිබ්බද, මෙහිදී බලපා ඇත. නව ජනපදිකයන්ගේ මුල් කන්න දෙකේදී වී නිෂ්පාදන අලෙවි කරම (පළබඳ) ගැටළුවලට ඉහත කරුණු බලපා ඇත.

නව ජනපදිකයන්ගේ අතුරු බෝග අලෙවිය සම්බන්ධව සලකා බලන විටද එය තරඟකාරී මිලට වඩා 50% ක් පමණ අඩුවක් පෙන්නුම් කරයි. අතුරු බෝග සම්බන්ධ ගොවීන් සහ වෙළඳපොල අතර සෘජු සම්බන්ධතාවයක් දැකිය නොහැක. කාලීන වශයෙන් වගා කෙරෙන සමහර අතුරු බෝග වල නිෂ්පාදන අතිරික්ත සඳහා සාපේක්ෂ වශයෙන් පහළ මිලක් ගොවීන්ට ලැබෙන බව පෙනී ගිය අතර අලෙවිය අතපසු වූ අවස්ථාද විරල නොවේ. නව ජනපදිකයන්ගේ පාරිභෝගික භාණ්ඩ වෙළඳපොල එදිනෙදා පාරිභෝගික අවශ්‍යතා පිරිමසා ගැනීමට පමණක් සීමාවී ඇත. ජනපදිකයා වැඩි ප්‍රමාණයක් පෞද්ගලික අංශයන් කෙරෙහි අවධානය යොමු කරන අතර ගමින් ගමට පිහිටා වූ සමූපකාර වෙළඳසැල් වලට ඇදෙන ජනකාය සාපේක්ෂව සීමිත වේ. පෞද්ගලික වෙළඳුන් තම ජනපදිකයන් සමග කිට්ටු සම්බන්ධතාවයකින් කටයුතු කරන අතර ඒ තුලින් ඔවුන් අතර වැඩි වෙළඳ සබඳතාවයක් ඇති කරගෙන ඇත.

කෙසේ නමුදු ඉහත වෙළඳ පොල රාමුව සීමිත අත්‍යාවශ්‍ය භාණ්ඩ කිහිපයක් මත පමණක් පදනම්ව ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදන හා පාරිභෝගික අවශ්‍යතා ලබා ගැනීම සඳහා ජනපදිකයන් සාමාන්‍යයෙන් සැ. 6 ක් පමණ දුරක ගමන් කරති. එම වෙළඳ සීමාව පැරණි උප නගර වන පන්නෙගමුව සහ දෙබරවැව වටා මධ්‍යගතව ඇත. එහෙත් රෙදිපිළි සහ සාප්පු බඩු සහ බෙහෙත් ද්‍රව්‍ය අවශ්‍යතා සඳහා සාමාන්‍ය දුර සැත. 6 - ක් ප්‍රමාණයක් ගෙවීමට සිදුව ඇත. වැඩි කොටසක් ඒ සඳහා තෝරාගනු ලබනුයේ තිස්ස නගරයයි.

නව ජනපදිකයන්ගේ සේවා අවශ්‍යතාවයන් සඳහා එනම් ගොඩනැගිලි ද්‍රව්‍ය, විකුණුම් සේවා උපකරණ විකුණුම් උපකරණ නඩත්තු යන අංශවල සැබෑ වෙළඳපොල නගරයන් පිහිටීමෙන් සැතපුම් 6, 4, 5 දක්වා දුරින් පිහිටා ඇත.



## කෘෂි නිෂ්පාදන අලෙවි හා ගැටළු:

කෘෂි නිෂ්පාදන අලෙවිය හා ඒ සම්බන්ධ ගැටළු ගැන සැලකීමේදී අපට ව්‍යාප්තියේ වම් ඉවුර හා දකුණු ඉවුර ගැන විශේෂ අවධානයකින් යුතුව කථා කිරීමට සිදුව ඇත. එයට හේතුව සමහර කරුණු සම්බන්ධව මෙම ඉවුරු දෙකෙහි තත්ත්වය දෙයාකාර වන නිසාය.

මෙම ප්‍රදේශයේ නිෂ්පාදන අලෙවි මාර්ග කිහිපයක් ඇත. ඒවා නම් ප්‍රදේශයේ පොලවල්, වී අලෙවි මණ්ඩලයේ ප්‍රාදේශීය ශාඛා සහ පෞද්ගලික වෙළඳුන්ය. ප්‍රාදේශීය වී වෙළඳ පලින් 70% ක් පමණ මිලයට ගන්නේ පෞද්ගලික වී මෝල් හිමියන් විසිනි.

නිෂ්පාදන අලෙවිය සම්බන්ධයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශවල කාර්ය භාරය සලකා බලන විට පෞද්ගලික අංශය කැපී පෙනෙන්නේ එහිදී අතිරේක ආහාර බෝග හා වාර්ෂික බෝග අලෙවිය සලකා බලන විට කැපී පෙනෙන්නේ පොලවල්ය. උදාහරණ වශයෙන් නව ගොවීන්ගේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක් වී ඇත්තේ පන්නෙගමුව හා තිස්ස යන පොලවල්ය. දකුණු ඉවුර ගොවීන්ට පොලවල් වලට භාණ්ඩ අලෙවි කිරීමේදී වැඩි පහසුකමක් හිමිවී ඇත. එයට හේතුව දකුණු ඉවුර පදිංචි අයට ගමන් පහසුකම් මෙන්ම පොලවල් සහ නගරවල ඇති දුර අඩුවීමත්ය. නමුත් වම් ඉවුර ගත්විට වෙළඳ පොල වෙත ඒමට වැඩි කාලයකුත් වියදමකුත් දැරීමට සිදුවී ඇත.

කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමට විවිධ මාර්ගයන් තිබුනත් ගොවීනට නිෂ්පාදන අලෙවීයේදී ගැටළු රාශියකට මුහුණ දීමට සිදුවන බව පෙනී යයි. මෙයට ප්‍රධාන හේතුවක් වන්නේ පොල පහසුකම් හා නාගරික මධ්‍යස්ථාන වල විසිරී යාමේ ආකාරයයි. තිස්ස, පන්නෙගමුව, ලුණුගම්වෙහෙර වැනි පැරණි මෙන්ම නව නගරද පිහිටා ඇත්තේ දකුණු ඉවුරට ආසන්නව වන අතර වම් ඉවුරේ ජනපදිකයින් ඉහත කී මධ්‍යස්ථාන කරා සාපේක්ෂක වශයෙන් වැඩිදුරක් යා යුතුය.

## යෝජිත උප නගර හා ඒවායේ අනාගතය:

වර්තමානයේ නව ජනපදිකයන්ගේ නිෂ්පාදන වෙළඳ පොල පන්නෙගමුව නගරය විසින් ආකර්ශනය කරගෙන ඇති අතර එහිදී නිෂ්පාදන සහ වෙළඳපොල විශ්වාසය තහවුරු කරගෙන ඇත. මෙයට මූලික හේතුව වශයෙන් පෙන්වා දිය හැක්කේ එම නගරයේ භූගෝලීය පිහිටීමයි. විශේෂයෙන් දකුණු ඉවුරේ සෑම ජනපදයක්ම සම්බන්ධ කරන ආකාරයෙන් මාර්ග පිහිටීමක් සහ දිගුකාලීන වශයෙන් පැවති වෙළඳ පුරුවක් මෙහි බලපෑමට හේතු වී ඇත. මෙම උප නගරය මගින් සිල්ලර මෙන්ම තොග වෙළඳපොල අවශ්‍යතා ඉටු කරවයි. ඊට අමතරව පන්නේගමුව පිහිටි පොල මගින් අතුරු බෝග නිෂ්පාදනය සඳහා හොඳ වෙළඳපොලක් සපයා දෙයි. බෙරලිහෙල, ලුණුගම්වෙහෙර, වීරවිල නව උප නගරවල ශක්තිය හා සැසඳීමේදී පන්නේගමුව නගරයේ වෙළඳ පිහිටීම නිෂ්පාදකයන් ඇද ගැනීමේ දැඩි හැකියාවක් පෙන්වයි. මෙයට හේතුව නව නගර හා සලකා බලන විට පන්නේගමුව අනිකුත් වෙළඳ මධ්‍යස්ථාන සමග සමීප සම්බන්ධතාවයක් පැවැත්වීමයි. පන්නේගමුවට අමතරව, පැරණි ජනපදයේ ප්‍රධාන නගර වන තිස්ස නගරයේ ද්විතීය පරිභෝජන අංශය සහ සේවා සඳහාද නව ජනපදිකයින් තිස්ස නගරයට වර්තමානයේ ඒකරාශී වෙනවා. මෙන්ම අනාගතයේදීත්, නව උප නගරවල වෙළඳපොල සීමාවන් ඉවත්වන තුරු, තිස්ස නගරය වටා නිෂ්පාදකයන් ඒකරාශී වේ. නව නගර වන ලුණුගම්වෙහෙර, වීරවිල නගර සාපේක්ෂ වශයෙන් පවතින ප්‍රධාන නගර සහ උපනගර අතර කිට්ටු සම්බන්ධතාවයන් ඇතිකර ගැනීමට උත්සාහ කළද වම් ඉවුරේ නව නගර වන බෙරලිය එම තරඟකාරී තත්ත්වයෙන් පසුබෑමක් ඇතිවිය හැක.

## සමාලෝචනය:

ඉදිරියේදී ලුණුගම්වෙහෙර ව්‍යාපාර ප්‍රදේශයේ ගොවීන්ගේ නිෂ්පාදන ප්‍රමාණය ඉහළ යාමත් සමගම අලෙවි පහසුකම් සැපයිය යුතු



අතර ඒ සඳහා දැනට පවතින බාධකද ඉවත් කළ යුතුව ඇත. මෙහිදී ප්‍රථමයෙන්ම කළ යුතුව ඇත්තේ පවතින නගර අතර මනා සබඳතාව යක් ඇති කළ යුතු වීමය. විශේෂයෙන් පන්නේගමුව, තිස්ස සහ වෙනත් අලෙවි මධ්‍ය ස්ථාන වලට ඇති සම්බන්ධය වැඩි කිරීම් සඳහා පහසුකම් සැපයිය යුතුය. ඒ සඳහා ක්‍රම වත් මාර්ග සේවයක් සැපයීමෙන් වඩාත් උසස් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවෙනු ඇත. දැනට සමහර නව ගම්මාන පවතින වෙළඳ මධ්‍යස්ථාන වලින් හුදකලාව පවතී. ඔවුන්ට අලෙවි මධ්‍යස්ථාන වලට පැමිණීමද අසීරු තත්ත්වයක පවතී. විශේෂයෙන් පොලවල් පහසුකම් අඩු වම් ඉවර ප්‍රදේශය ආශ්‍රිතව නව පොලවල් ආරම්භ කිරීමෙන් ඔවුන්ටත් අලෙවි මධ්‍යස්ථාන පහසුකම් සැපයිය යුතුව ඇත.

දැනට ප්‍රදේශයේ පිහිටුවා ඇති රජයේ අලෙවි ආයතන වල තත්ත්වය වඩා කාර්යක්ෂම කළ යුතුව ඇත. ගොවීන්ගෙන් වී මිලදී ගැනීමේදී වඩාත් පුළුල් පහසුකම් සැපයිය යුතුය. නිෂ්පාදන මිලදී ගන්නා විට ගොවීන් ආයතන වලට ගෙන්වා ගන්නවා වෙනුවට ගොවින් ළඟටම ගොස් නිෂ්පාදන මිලදී ගැනීමේ ක්‍රමයක් ඇතිකළ යුතුය. නිෂ්පාදකයින්ගෙන් දැනට රජයේ ආයතන වැඩි වශයෙන් ලබා ගන්නේ වී පමණකි. නමුත් ඉදිරියේදී අතිරේක ආහාර බෝග සහ වෙනත් නිෂ්පාදනද ගොවීන්ගෙන් මිලදී ගැනීමට ක්‍රමය සැලසිය යුතුය. එවිට නිෂ්පාදකයින්ට අතිරේක ආහාර බෝග සඳහාද හොඳ මිලක් ලබා ගැනීමට හැකිවන අතර, අතර මැදියන් වෙත යන වෙළඳ පිරිවැය අඩුකළ හැක.

පැරණි නගර සහ නව නගර අතර තරඟකාරී සබඳතාවයන් ගොඩ නැගීමට නම් නව උප නගරවල් තුළ සංවිධාන වෙළඳපොල ව්‍යුහයන් ගොඩ නැගිය යුතුවේ. මෙය ව්‍යාපෘතියේ දීර්ඝ කාලීන කෘෂිවර්ධනයට හේතු විය හැක.